# සුදු නෙළුමේ සාම පාරමිතාව





1995 ජූලි මස 8 වැනි සෙනසුරාදා
කොළඹ සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනයේ
පැවති

සුදු නෙළුම් ව්‍යාපාරයේ

සමාරම්භක උත්සවය අමතමින්

අතිගරු ජනාධිපතිනී
**චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය**

විසින් පවත්වනු ලැබූ කථාව.

සුදු නෙළුම් මලෙන් සංකේතවත් කරන්නේ, සාමය, පවිත්‍රතාව, සමෘද්ධිය යන මේ වටිනා දේවල්. අද බෙදුම්වාදයෙන්, කුරිරු යුද්ධයකින්, මහා අගාධයකට ඇද දමා තිබෙන අපේ රටට සුදු නෙළුම් ව්‍යාපාරය තුලින් නැවත වතාවක් සාමය, සමෘද්ධිය උදා කරන්නට, සහෝදරත්වය උදා කරගන්නට හැකි වේවායි කියා නමුන්නාන්සේලා සියළු දෙනා සමග ම මා ප්‍රාර්ථනා කරනවා.

"බෙදුම් වාදයෙන්. කුරිරු යුද්ධයෙන් මහා අගාධයකට ඇද දමා තිබෙන අපේ රටට සාමය. සමෘද්ධිය හා සහෝදරත්වය යළි උදාකරලීම සුදු නෙළුම් ව්‍යාපාරයේ අරමුණයි."

අපේ සංස්කෘතිය තුලින් පැරණි කාලයේ සිටම නෙළුම් මල සංකේතවත් කලේ පවිත්‍රතාව සහ සමෘද්ධියයි. ඒ වගේම සුදු පාට සංකේතවත් කලේ සාමයයි. වෙන කිසිම මලකට වැඩිය වෙනස්ව බොර දියෙන් මතුවන ලස්සනම කුසුම නෙළුම් මල බව අපි දන්නවා. අද අපේ රට, අපේ දේශය කියන මේ ලංකාව මහා මඩ ජොහොරක් බවට සෑම අතින්ම පත්ව තිබෙන වෙලාවක ඒ තුලින් සුදු නෙළුමක් පිපෙන්නාසේ, අපි නමුන්නාන්සේලා මේ රටේ ජීවත්වන සියළුම පොදු ජනතාව සියළු භේද වලින් තොරව අපේක්ෂා කරන ඒ සාමය, සහෝදරත්වය හා සමෘද්ධිය ගොඩ නගන්නට අද මෙතනදී ප්‍රාර්ථනා කර ගනිමු.

අවුරුදු දස දහස් ගණනාවක් තිස්සේ අපේ මේ පුංචි රටේ මිනිසුන් ජීවත්වන බව අප දන්නවා. අවුරුදු දෙදහස් පන්සියක තරම ලිඛිත ඉතිහාසයක් තිබෙන අප රටේ ප්‍රධාන වශයෙන් විවිධ ජන වර්ගයන් ජීවත්වන බවත් අප දන්නවා. මිහිඳු මහ රහතන් වහන්සේ ලංකාවට බෞද්ධ ධර්මය

මීට අවුරුදු දෙදහස් ගණනකට පෙර රුගෙන ආ වේලේ සිටම අප රටේ එදා ජීවත් වුන ජන කොටස වාගේම ලෝකයේ නොයෙක් ප්‍රදේශ වලින් අපේ රටට විවිධ ජන කොටස් පැමිණ මේ රටේ පදිංචි වෙලා අප සමග එකට ජීවත් වන බවත් අප දන්නවා.

ඈත අතීතයේ සිටම ඉන්දියාවේ නොයෙකුත් ප්‍රදේශ වලින්, දකුණු ඉන්දියාවෙන්, උතුරු ඉන්දියාවෙන්, බටහිර ඉන්දියාවෙන් ජනකොටස් අප රටට පැමිණ මේ රටේ පදිංචි වුනා . ඒවගේම බුරුම දේශයෙන් අපේ රටට පැමිණි සුළු ජන කොටසක් මේ රටේ පදිංචි වුන බවත් අප දන්නවා

ඒ වගේම ඈත අරාබිකරයෙන් ලංකාවට ජන කොටස් පැමිණ අපේ රටේ යම් යම් ප්‍රදේශ වල පදිංචි වෙලා තවමත් අප සමග ජීවත් වෙනවා.

මේ ජන කොටස් විවිධ ජන වර්ග වලට, විවිධ ආගම් වලට අයත් වුන අය වන අතර, විවිධ භාෂාවන් විවිධ සංස්කෘතින් උපයෝගී කර ගත් අය බවත් අපි හොඳින් දන්නවා.

මේ සියළුම ජන කොටස් ඒකරාශි කර ගනිමින් ලාංකීය දේශයක් ගොඩ නගන්නට අපේ මුතුන් මිත්තන්ට හැකි වුනා. ඒ ඒ ජන කොටස් වලට අයිති අය තම තමන්ගේ සංස්කෘතීන් තමන්ගේ භාෂා ආගම් වෙන වෙනම පවත්වා ගෙන ගිය අතර, අපි සියළු දෙනා ට එකට එකතුව සිංහල බෞද්ධ සංස්කෘතියේ ප්‍රධානත්වයෙන් එක ලාංකීය දේශයක් ගොඩ නගන්නට හැකි වුනා. අවුරුදු පන්සියයකට කිට්ටු කාලයක් පෘතුගීසීන්, ලන්දේසීන් හා ඉංග්‍රීසීන් විසින් අපේ රට පාලනය කොට අප

සංස්කෘතිය තුල ඇති කරපු විපර්යාසයන් තුලින් 1948 නිදහසත් සමග අප දායාදය කර ගත්තේ බෙදුම් වාදයේ බීජ හොඳින් වපුරා තිබුන දේශයක්.

1948 දේශපාලන නිදහස ලබා ගත්තාට පසු සිට අද දක්වා ගතවී තිබෙන වසර පනහකට කිට්ටු කාලය තුලදී අපට තවමත් අප සමග එකට ජීවත්වන සියළුම ජන කොටස් ඒකරාශි කරගෙන එක ලාංකීය අනන්‍යතාවක්, ලාංකීය පෞරුෂයක්, සමාජීය වශයෙන්, සංස්කෘතිය වශයෙන්, දේශපාලන වශයෙන් ගොඩනගාගන්නට නොහැකි වීම ඇත්ත වශයෙන්ම විශාල අඩුවක් හැටියට පිලිගත යුතුයි. මේ රටේ ජීවත් වන බහුතර සිංහල බෞද්ධ ජනතාව වන අප සමග ජීවත්වන සිංහල ක්‍රිස්තියානි ජනතාව, ද්‍රවිඩ හින්දු ජනතාව, ද්‍රවිඩ ක්‍රිස්තියානි ජනතාව, මුස්ලිම් ජනතාව, මේ සියළු දෙනාම ඒකරාශි කරගෙන එක ලාංකීය පෞරුෂයක් ඇති ශක්තිමත් දේශයක් ගොඩ නැගීමේ කාර්යය මා හිතන හැටියට අද ලාංකිකයන් වශයෙන් තමුන්නාන්සේලා අපි සියළු දෙනාම ඉදිරියේ තිබෙන ප්‍රධානතම අභියෝග කියල කිව්වොත් එය නිවැරදියි.

"ලෝකයේ විවිධ රටවලින් මෙරටට සංක්‍රමණයවූ නොයෙක් ආගම් අදහන ජාතීන් ඒකරාශි කොට ඒකීය ලංකාවක් ගොඩ නගන්නට අපේ මුතුන් මිත්තන්ට හැකි වුණා."

අද අපි වැඩිදෙනෙක් අවුරුදු දහතක් තිස්සේ සටන් කරල, අවුරුදු දහතක් තිස්සේ අනේක දුක් කරදර හිංසාවලට මුහුණ දීල මේ ලබා ගත් ජයග්‍රහණය බුක්ති විඳිම සඳහා නොයෙකුත් දේවල් බලාපොරොත්තු වෙනවා. අපේ ගම්වල ජනතාව රැකී රක්ෂා ලැබුනා මදි කියල ප්‍රකාශ කරනවා. සමහර අය නදින්ම විවේචනය කරනවා. අපි බලාපොරොත්තු වන සංවර්ධන වැඩ පිළිවෙල

මේ ඉතා කෙටි කාලය ඇතුලත වත් ඉක්මනට නොකෙරුවා කියල සමහරු රජය විවේචනය කරනවා. මේ සියල්ල ආර්ථික සංවර්ධනය තුලින් අපිට ලබාගන්නට අපහසු වන්නේ නැහැ. නමුත් මොකක් ලබා ගත්තත් මේ රටේ ජාතිවාදී අරගලය විශේෂයෙන් උතුරු නැගෙනහිරත් එයින් පිටාර දුවන ප්‍රතිඵල රටේ මුළු හැම තැනමත් අපි දකින තෙක් මොන සංවර්ධනයක් කෙරුවත් එහි ප්‍රතිඵල අපි කාටවත් හරියාකාරව ලබාගන්නට නොහැකි බව තමුන්නාන්සේලාට මා විශේෂයෙන් කිවයුතුයි. පසුගිය රජය විසින් අන්ත විනාශයට ඇද දමා තිබුන අපේ ආර්ථිකය ඉතා කෙටි කාලයක් ඇතුලත නැවත හරි මගට යොමු කරමින් අප ජනතාවට ඇතිවී තිබෙන අති විශාල ආර්ථික ප්‍රශ්න විසඳීම සඳහා පැහැදිලි ප්‍රතිපත්තියක් හදගෙන එය ඉදිරියට ගෙන යන්නට පටන් ගත්තා පමණයි. නැවත වතාවක්, අඩු තරමින් රුපියල් දශලක්ෂ පන්දහක් පමණ වැය කරන්නට සිදුවුන යුද්ධයක් උතුරු නැගෙනහිර ආරම්භ වුනා. අපේ ගම්වල ජීවත්වෙන තරුණ සහෝදරවරු යුද්ධයට ගිහිල්ලා රට වෙනුවෙන් සටන් කරල ජීවිත පූජා කරමින් මල මිනී දූසිම් පිටින් ගම් වලට ගෙනඑන තත්වය දැන් අවසානයි කියල මව් පියවරුන් යාන්තම් හුස්ම හෙලන කොට නැවත වතාවක් ඒ මිනී පෙට්ටි ගම් වලට එන්න පටන් ගත්තා.

එක්තරා කාලයක මේ රටේ ජීවත් වුන සුළු ජාතීන්ට ප්‍රධාන වශයෙන් දෙමළ ජනතාවටත් එක්තරා දුරකට මුස්ලිම් ජනතාවටත් ඔවුන්ට ඔවුන්ගේ මූලික මිනිස් අයිතිවාසිකම් සහ, ආර්ථික අයිතිවාසිකම් ලබා ගැනීම සඳහා විශාල සටනක් කරන්නට සිදුවුනා. ඒ නිසාම ඔවුන් දීර්ඝ කාලයක් තිස්සේ මේ අයිතිවාසිකම් සඳහා ප්‍රජාතන්ත්‍රවාදීව

සටන් කරල එය ඊට වැඩිය ඉක්මනට ලබාගන්න පුළුවන් වේවි කියල සිතූ නිසා අවි ආයුධ අතට අරගෙන විනාශකාරි යුද්ධයකට පෙළඹුනා.

1977න් පසු ද්‍රවිඩ ජනතාවට තමන්ගේ ප්‍රශ්න විසඳා ගන්නට තිබුන හැකියාවන් තව දුරටත් ඈහිරිලා ගියා කියා සිතන්නට විශේෂ හේතු තිබුනා. ද්‍රවිඩ ජනතාවගේ ලියලමින් තිබුන ප්‍රශ්න වලට සාමකාමීව සාකච්ඡා මාර්ගයෙන් දේශපාලන විසඳුම් සොයනවා වෙනුවට ගහල, තලල පෙළල, මිනී මරල, අමු අමුවේ පුච්චල ඔවුන්ව බිය ගන්වල ප්‍රශ්න විසඳන්න පුළුවන් වෙයි කියල හිතපු ආණ්ඩුවක් මේ රටේ බලයට පත් වුනා. ද්‍රවිඩ ජනතාවට පමණක් නොවේ මේ රටේ ජීවත් වන, ආණ්ඩුවට විරුද්ධ වූ සියළු දෙනාටම ජාති භේදයෙන් තොරව විරුද්ධවාදීකම් කරමින්, භීෂණය පෙන්වමින්, රාජ්‍ය ත්‍රස්තවාදය තුලින් මෙල්ල කර ගන්නට පුලුවන් කියල හිතපු රජයක් මේ රට පාලනය කලා අවුරුදු දහතක් තිස්සේ. එහි ප්‍රතිඵල හැටියට දකුණේ තරුණයින් අවිආයුධ අතට අරගෙන ඔවුන්ට රජයෙන් උගන්වපු භීෂණය, රජය ඉගැන්නුවාට වැඩිය හොඳට මෙහෙයවමින් මේ ප්‍රදේශවල අති භයංකාර විනාශයක් ඇති කෙරුවා. උතුරේ තරුණයින් ඉන්දියාවට පැන ගොස් ඉතා සාර්ථකව සංවිධානය වෙමින් ආපසු උතුරුකරයට ඇවිල්ලා දැන් අවුරුදු දහතුනකට කිට්ටු කාලයක් තිස්සේ විනාශකාරි යුද්ධයක් ආරම්භ කරල අද වන තෙක් පවත්වා ගෙන යනවා. එද ද්‍රවිඩ ජනතාව අඩු තරමින් විවෘතව සහයෝගය

"1948 දී ලැබුණ දේශපාලන නිදහසින් පසුව, අප රටේ ජීවත් වන සියළුම ජන කොටස් ඒකරාශි කොට අපේම අනන්‍යතාවයකින් යුත් ඒකීය ලංකාවක් ගොඩ නගා ගැනීමට මේ වන තෙක් අපට හැකිවී නැහැ."

නුදුන්නත් වක්‍රව හෝ හිතෙන් හෝ හිත යටින් හෝ මේ සටනට අඩු තරමින් යම් කිසි සහයෝගයක් දැක්වූවා. අපට වෙන කිසි මාර්ගයක් නැති නිසා වෙන විකල්පයක් නැති නිසා, අඩු තරමින් අපි වෙනම රාජ්‍යයක් ඉල්ලිය යුතුයි කියන අදහස දෙමළ හුඟ දෙනෙක් තුල තිබුනා. එසේ හිතුවේ වෙනම රාජ්‍යයක ජීවත්වෙන්න තිබුන කැමැත්ත නිසා නොවේ. කොළඹ සිටින දෙමළ ජනතාව තමන්ගේ ව්‍යාපාරික ජීවිත, පරම්පරා ගාණක් තිස්සේ ජීවත්වුන ගෙවල් දොරවල්, වතුපිටි අත ඇරල යාපනයට ගිහිල්ල ජීවත්වෙන්න හිතපු නිසා නොවේ. වෙන කිසිම විසඳුමක් අපිට මින් ඉදිරියේ නැහැ කියල හිතපු නිසයි.

අද පොදුජන එක්සත් පෙරමුණු රජය විසින් මේ රටේ ජීවත් වන දෙමළ ජනතාවට පමණක් නොවෙයි සියළුම සුළු ජාතීන්ටත්, සියළුම ආගම් වලට අයිති අයටත්, එකට එක්ව සහෝදරත්වයෙන් ඒ සියළු දෙනාටම අයිතිවිය යුතු අයිතිවාසිකම්, වරප්‍රසාද ලබා ගෙන සිංහල බෞද්ධයන් සහ අනෙකුත් සියළු දෙනාම එක රටක්, එක දේශයක්, එක ජනතාවක් හැටියට ජීවත් වෙන්නට පුළුවන් වන රටක් ගොඩ නගන්නට හැකි බව සමස්ත ලංකාවටම ඒත්තු ගන්වලා ඉවරයි. ඒ තුල ජාතිවාදයට තැනක් නෑ මිත්‍රවරුනි, ඒ තුල ආගම් වාදයට තැනක් නෑ. ඒ තුල මොන ආකාරයේ හෝ බෙදුම් වාදයට තැනක් නෑ. අපි නව දුරටත් එක එක කොටස් හැටියට බෙදිල, එක එක කොටස අනික් ජන කොටසට වැඩිය වරප්‍රසාද ලබා ගෙන, අනෙක් අය පාගා ගෙන, අපිට පමණක් නැඟී සිටින්නට පුළුවන් කියල හිතුවොත් අපි විතරක් නෙමෙයි අපේ ලංකාවත් අපේ රටත් අපේ දේශයත්

අපිට නැතිවන බව නිසැකයි කියල තමුන්නාන්සේලාට විශේෂයෙන් සඳහන් කළ යුතු නැහැ. අද සිංහල බෞද්ධයින් අනෙකුත් අයට වැඩිය හොඳින් ජීවත් වෙනවාද කියන එක නෙමෙයි ප්‍රශ්නය. උතුරේ ද්‍රවිඩ එල්. ටී. ටී. ඊ. ය අනෙක් හැම කෙනාම මරා ගෙන, තමන්ට විරුද්ධ වෙන - තමන්ගේම ජාතිකයින් පවා, මරාගෙන ඔවුන් පමණක් ජීවත් වනවාද කියන එක නෙමෙයි ප්‍රශ්නය. අද අප ඉදිරියේ තියෙන, පොදුවේ අප සැම දෙනාම මුහුණ දෙන ප්‍රශ්නය අපි රටක් හැටියට මේ ලංකාව නව දුරටත් ඉදිරියට ගෙන යන්නට පුළුවන්ද නැද්ද කියන එකයි. මේ යුද්ධය නිසා අද අවුරුදු 12ක් තිස්සේ මේ රටේ ජනතාව ලෝකයේ දියුණුම රටක් හැටියට දියුණු කරන්නට තිබුන මහා සම්පත් රාශියක් යුද්ධයට වක්කරලා තියෙනවා. අද රට වෙනුවෙන් විශාල කැපවීම් කරමින් රට ගොඩ නගන්නට අපේ ආර්ථික සංවර්ධනය සඳහා නායකත්වය දෙන්නට හිටපු සිංහල, දෙමළ, මුස්ලිම් තරුණයින් ලක්ෂයකට කිට්ටු ගණනක් මේ යුද්ධය නිසා ජීවිත විනාශ කර ගෙන තියෙනවා. තව දුරටත් දේශයක් හැටියට රටක් හැටියට, මේ විනාශයට අපට වැඩි කලක් මුහුණ දෙන්නට බැරි බව මම හිතන හැටියට අපි හැම දෙනාම හදවතට අවංකව තට්ටු කරල ඇසුවොත් දැන ගන්නට පුළුවන්.

"විශේෂයෙන් උතුරු නැගෙනහිර පවතින ජාතිවාදී අරගල සමථයකට පත්වන තෙක් සංවර්ධන ක්‍රියාවලියේ සම්පූර්ණ ප්‍රතිඵල ලබාගත නොහැකියි."

අද අප ඉදිරියේ තිබෙන ප්‍රධානතම අභියෝගය මේ යුද්ධය නවතා දැමීම පමණක් නොවේ. නැවත වතාවක් මෙවැනි යුද්ධ ආරම්භ නොවන්නට ඒ යුද්ධයට මුල් වුන ප්‍රධාන ප්‍රශ්නවලට ස්ථිරසාර විසඳුම්

දේශපාලන මාර්ගයෙන් ලබා දීමය කියන එකත් තමුන්නාන්සේලාට මං මතක් කරන්න කැමතියි.

එය ලෙහෙසි පහසු කාර්යයක් නොවන් බවත්, රහසක් නොවේ. ඒ කටයුත්තට 1948 සිට මේ රට පාලනය කරපු වැඩිදෙනෙක් මුහුණ දෙන්නට අකමැති වුනා. හේතු මා මෙතන විග්‍රහ කරන්න යන්නේ නැහැ. සියළුම රජයන් ඔය ප්‍රශ්නයට කෙලින් මුහුණ දීල ස්ථිරසාර දීර්ඝකාලීන විසඳුම් ලබා දෙන්නට මැලි වුනා නොයෙකුත් හේතු නිසා. මේ අභියෝගය අපි කෙළින්ම භාරගත්ත බව පසු ගිය වසරේදී මේ රටේ පැවතුන දේශපාලන සෑම කටයුත්තකදීම ජනතාවට ප්‍රකාශ කෙරුවා. විශේෂයෙන්ම 1994 පැවතුන මැතිවරණ තුනේදීම අපි ප්‍රකාශ කලා තමුන්නාන්සේලා සියළු දෙනාගේම නායකත්වයෙන් ලංකාවේ හතර දිග් බාගේ සෑම ගමකම, සෑම නගරයකම ඒ අපි දියත් කරපු සටන තුලින් අපි ප්‍රකාශකරල, ඒ සඳහා මේ රටේ බහුතර ජනතාවගේ අති විශාල වරමක් ලබා ගත්තා.

ඒ නිසාම තමයි අපි ආණ්ඩු බලය ලබා ගත් විගසම දින කීපයක් ඇතුලත මේ ප්‍රශ්නයට විසඳුම් සොයන්නට කටයුතු ආරම්භ කෙරුවේ. තමුන් උතුරේ ප්‍රශ්න විසඳන්නට විතරක් අපි පෙළඹුනේ නැහැ. රජයේ මැති ඇමතිවරු, මන්ත්‍රීවරු වැඩි වශයෙන් අපි තමුන්නාන්සේලාට පොරොන්දු වුන ආර්ථික සංවර්ධනය, සමාජ සංස්කෘතික සංවර්ධනය බිහි කරන්නට ඉදිරියට ගෙන යන්නට ක්‍රියා කල අතර, ඒ සඳහා මගේ වෙලාවෙනුත් අඩු තරමින් 60% - 70% ක් ගත කරපු අතර,අපි දවසකට පැය 16 -18 කටයුතු කරමින් මේ ප්‍රශ්නයට විසඳුම් සොයන්නට පෙළඹුනා. පැහැදිලි ප්‍රතිපත්තියක් වැඩ පිළිවෙලක් අපි හදගත්තා. සාම ප්‍රයත්නය ලෙහෙසි එකක් නොවන බව අපි දැන ගත්තා.

කණගාටු වන්නේ මේ රටේ ජනතාවට බණකියන පත්‍ර කලාවේදීන් ඇතුළු අනෙක් හැම දෙනාටම එය වටහා ගන්නට නොහැකි වීමයි. මේ වාගේ විනාශකාරි යුද්ධයක් විසඳන්නට මේ තරම් ඔඩුදුවපු ප්‍රශ්නයක් විසඳන්නට යෙදෙන කොට අපිට දවසින් දවසට හැම කෙනාටම අපේ ප්‍රතිපත්තිය, අපේ වැඩ පිළිවෙල, අපේ උපාය මාර්ග මොනවද කිය කියා මේ කටයුත්තේ යෙදෙන්නට බැහැ. ලෝකයේ කිසිම රටක මෙවැනි ප්‍රශ්න විසඳපු ආණ්ඩු එහෙම කෙරුවෙත් නැහැ. නමුත් අපේ රජයෙන් අනුගමනය කරන විවෘත භාවය නිසා හැකි තරම් දුරට හැම අවස්ථාවකදීම දැනුම් දුන්නා. පැහැදිලිව උතුරේ ජනතාවත් තමුන්නාන්සේලා අපි වාගේම මේ යුද්ධය නිසා හෙම්බත්වෙලා අද සාමය අපේක්ෂා කරන බව දැන සිටිය නිසා අපේ සාම ප්‍රයත්නයේ පළමුවැනි, දෙවැනි සහ අන්තිම ඉලක්කය වුනේ උතුරේ සහ නැගෙනහිර ද්‍රවිඩ ජනතාව සාමය පැත්තට දිනා ගැනීමයි. ඒ කටයුත්ත සඳහා අපි වැඩ රාශියක් කෙරුවා. ඒ කටයුත්ත සඳහා එල්.ටී.ටී.ඊ. ය සමගත් සාකච්ඡා කෙරුවා. එල්.ටී.ටී.ඊ. ය සමග සාකච්ඡා කිරීම අපේ සාම ප්‍රයත්නයේ එක ප්‍රධාන අංගයක් පමණයි. ඒ සාම ප්‍රයත්නයේ පළමුවෙනි අදියරේ ප්‍රධානතම ඉලක්කය වුනේ ද්‍රවිඩ ජනතාව, සමස්ත ද්‍රවිඩ ජනතාව සාමය පැත්තට, අපේ පැත්තට දිනා ගැනීමයි. අපේ පැත්ත කියන්නේ මෙතැන පටු දේශපාලනය ගැන නෙමෙයි මම කථා කරන්නේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට නෙමෙයි, පොදු ජන එක්සත් පෙරමුණට නෙමෙයි. නමුත්, සාමය පැත්තට දිනා

**"සාමයෙන් සාමය උදා කර ගත නොහැකි නම් වෙනත් ඕනෑම මාර්ගයකින් හෝ සාමය උදා කර ගත යුතුය. ඒ කියන්නේ යුද්ධ කරලා දම්ලුත් විනාශ කිරීම නෙමෙයි. සාමයට විරුද්ධ වන එල්.ටී.ටී.ඊ. යට එරෙහිව යුද්ධ කිරීමයි."**

ගැනීමයි අපේ ප්‍රධාන ප්‍රයත්නය වුනේ. ඒ ප්‍රයත්නය අද විශාල වශයෙන් අප ජයග්‍රහණය කරල ඉවරයි කියල තමුන්නාන්සේලාට මා ප්‍රකාශ කල යුතුයි.

උතුරේ ජනතාවත් දකුණේ ජනතාවට මෙන්ම අද පිළි අරගෙන ඉවරයි මේ රටේ පවතින ජන වාර්ගික ප්‍රශ්නයට අවංකව විසඳුම් ලබා දෙන්නට දැන් සිටින රජය සූදානම් බව. එහෙම නම්, රජය සූදානම් වෙලා සිටිනවා නම් ද්‍රවිඩ ජනතාවගේ මේ රටේ සුළු ජාතින්ගේ ප්‍රශ්න වලට අවංකව, දිගු කාලීන විසඳුම් ලබා දෙන්නට, ඒ නිසා අපට දැන් යුද්ධයකින් වැඩක් නැහැ කියන තත්වය බහුතර දෙමළ ජනතාව පිළි අරගෙන ඉවරයි. අද ඒ දෙමළ ජනතාවගේ අපේක්ෂාවන්ටත්, ප්‍රාර්ථනාවන්ටත් විරුද්ධව එක ද්‍රවිඩ සංවිධානයක් පමණක් යුද්ධයක් මෙහෙයවලා. ඒ ,එල්.ටී.ටී.ඊ. සංවිධානයයි. යුද්ධය මෙහෙයවූයේ එල්.ටී.ටී.ඊ. සංවිධානය නිසා අපිට ඔවුන් සමග සාකච්ඡා කරන්නට සිදුවුනා. සමහරුන් කියනවා වාගේ එල්.ටී.ටී.ඊ. ය ගැන බොළඳ විදියට අපි කිසිම මොහොතක රැවටිලා හිටියෙ නැහැ. එල්.ටී.ටී.ඊ. සංවිධානය කියන්නේ කුමක්ද කියල අපි පැහැදිලිව වටහාගෙන හිටියා. භීෂණය සහ මිනීමැරුම මුල් කර ගත්ත තමන්ට විරුද්ධ වුන තමාගේ සගයා පවා මැරීමෙන් පමණක් ප්‍රශ්නය විසඳන සංවිධානයක් බවට එල්.ටී.ටී.ඊ. සංවිධානය පත්වී තිබෙන බවත්, අපි දැනගෙන හිටියෙ නැත්නම්, අපි අන්තිම මට්ටමේ මෝඩයන් වෙන්න ඕන. ඒ සියල්ල විග්‍රහ කරගෙන, ඒ සියල්ල පිළිබඳ සැලසුම් කරගෙන මොවුන් යුද්ධය මෙහෙයවන නිසා මොවුන් සමග සාකච්ඡා කරන්නේ නැතුව වෙන කා එක්ක සාකච්ඡා කරල ද ප්‍රශ්නය විසඳන්නෙ? එල්.ටී.ටී.ඊ. ය සමග සාකච්ඡා කෙරුවේ

මෝඩ කමට බොළඳ කමට කියල පත්තරවල කතු වැකි ලියන ඒ කර්තෘ වරුන් සමග සාකච්ඡා කරලද අපි යුද්ධය නවත්වන්නෙ? අපිට එරෙහිව අවි අමෝරා ගෙන කවුරු හෝ හතුරෙක් වුනත් අපි ඉදිරියට ඇවිල්ල අපි සමග සටන් කරනවා නම් එක්කො තුවක්කුව අරගෙන කෙලින්ම එයාව මරන්න ඕන. අපිට එහෙම ශක්තියක් නැත්නම් පළමුවෙන් ඔවුන් සමග සාකච්ඡා කරල බලන්න ඕනෙ. අපි අනුගමනය කෙරුවේ ඒ දෙවැනි මාර්ගයයි. අපි අවංකව, ඇත්ත වශයෙන්ම අපේ හද පත්ලෙන්ම ප්‍රජාතන්ත්‍රවාදය සඳහා කැපවුනු රජයක් හැටියට පළමුවෙන් මොවුන් සමග සාකච්ඡා මාර්ගයෙන් මෙය නිම කරන්න පුළුවන්ද කියල බැලුවා. අපි එතැන එල්.ටී.ටී.ඊ. සංවිධානය ගැන පමණක් නොවෙයි හිතුවේ. සාමය අපේක්ෂා කරන උතුරේ ජනතාව එල්.ටී.ටී.ඊ. ය ආරක්ෂා කරන ජනතාවගේ බලපෑම් තුලින් ඔවුන්ගේ අදහස් සමහර විට වෙනස් වෙයි කියලා. ඉතිහාසයේ එහෙම සිදුවුනු අවස්ථාවන් අනන්ත අප්‍රමාණ තියෙනවා. නමුත්, මේ එල්.ටී.ටී.ඊ. ය එහෙම වෙනස් වෙන්න සූදානම් නැති බව දැන් අපි දෙමළ ජනතාවටත් ඔප්පු කරලා, එල්.ටී.ටී.ඊ. යට වක්‍රවත් කෙළින්මත්, නොයෙකුත් ආකාරයෙන් අනේකවිධ සහයෝගය දුන්න මුළු ජාත්‍යන්තර ප්‍රජාවටම ඔප්පු කරල ඉවරයි.

අපි අවංකව සාම ප්‍රයත්නයේ යෙදුන නිසා, අපි අවංකව සාමය සඳහා රජයක් වශයෙන් කරන්නට පුළුවන් උපරිමය කරපු නිසා අද මුළු ලෝකයේම රටවල් පිළි අරගෙන ඉවරයි එල්.ටී.ටී.ඊ. ය වැරදියි

> "මුළු රටටම බලපාන සමාජ, ආර්ථික හා සංස්කෘතික ප්‍රශ්න වලට විසඳුම් සොයන අතර ඊට ප්‍රධාන බාධකය වන ජනවාර්ගික ප්‍රශ්නයට ස්ථිරසාර විසඳුමක් ලබා දීම අපේ අරමුණයි. එය දේශපාලනමය එකක්."

කියලා. එද එක්සත් ජාතික පක්‍ෂ රජය වෙලාවේ, එක්සත් ජාතික පක්‍ෂයට වසර දෙකක් තිස්සේ ලෝක බැංකුව ඇතුළු අපේ රටවලට ආධාර දෙන ආයතන සියල්ල එක සත පහක් දෙන්නේ නැතුව නවත්වල තිබුන වෙලාවක, අපි ආණ්ඩු බලය අතට ගත්තෙ. 1993 සහ 94 වර්ෂ වල ලංකාවට ආධාර සත පහක් ලැබුනෙ නැහැ. සම්පූර්ණයෙන් කපල තිබුනේ ඇයි? එක පැත්තකින් මුළු රටේම මානව අයිතිවාසිකම් පිළිබඳව යූ. ඇන්. පී. රජයෙන් අනුගමනය කර තිබුන වැරදි වැඩ පිළිවෙල ප්‍රතික්ෂේප කිරීමක් හැටියටත්, අනිත් පැත්තෙන් උතුරේ යුද්ධය සඳහා කිසිම මොහොතක අවංක සාම ප්‍රයත්නයක් දැරුවේ නැති නිසාත්, මේ රටවල් දිගින් දිගටම අවුරුදු 12 ක් 10 ක් තිස්සේ කියලා අන්තිම අවුරුදු දෙක තුළ සම්පූර්ණයෙන් ආධාර දීම නවත්තල තිබුනා. අද අපේ පස්සෙන් එනවා ආධාර අරගෙන. අවුරුදු 17 ක් තිස්සෙ එක්සත් ජාතික පක්‍ෂයට එක වර්ෂයක් සඳහා ලැබුන ආධාර වලට වැඩි ආධාර ප්‍රමාණයක් අපිට පැරිසියට ගිහිල්ලා එල්.ටී.ටී.ඊ. ය යුද්ධ ආරම්භ කරලා දවස් 10 කට පස්සෙත් ලබා ගන්නට හැකිවුනා. ඒ ආධාර ලබා ගන්න සාකච්ඡා කරන කොට එල්.ටී.ටී.ඊ. ය නැවත යුද්ධය ආරම්භ කලා. අපි පැරිසියේ ඉඳගෙන ඒ මුදල් ලබාගෙන, ඒ පිළිබඳ සන්තෝෂ වෙලා පැය 12 ක් ගියේ නැහැ අපිට දැනගන්න ලැබුනා පලාලි කඳවුරේ අහස් යාත්‍රා දෙක වෙඩි තබා පහත් කරපු බව. නමුත්, ඒ ආධාර එසේම ලැබෙනවා. ඊට අමතරව උතුර සහ නැගෙනහිර සංවර්ධනය කල යුතුයි. අද මේ තියෙන තත්වය යටතේ උතුර සංවර්ධනය කරන්න බැහැ. නමුත්, නැගෙනහිර සංවර්ධන කටයුතු ආරම්භ කරන්නටත් ඒ සඳහා රටවල් ගණනාවක්ම

ආධාර, ( ඒවා ණය මුදල් නෙමෙයි ආධාර ) දෙන්නත් පොරොන්දු වෙලා තියෙනවා. ඒ තත්වය එසේ ඇතිවී තිබෙන්නේ අර පත්‍ර කර්තෘ වරුන්ට වැඩිය, පාර්ලිමේන්තුවේ කෑගහන සමහරුන්ට වැඩිය හොඳ දේශපාලන බුද්ධියක් තිබෙන, දේශපාලන වශයෙන් අත්දැකීම් තියෙන දේශපාලනඥයන් විසින් පාලනය කරන, ප්‍රධාන රටවල ආණ්ඩු, අපේ ආණ්ඩුව ගැන පැහැදිලි නිගමනයකට එළඹිලා තියෙන නිසයි.

දැන් සාම ප්‍රයත්නයේ පළමුවෙනි අදියර ඉතා කෲර ලෙස එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් අප්‍රේල් 19 වෙනිද නිම කෙරුවා. කිසිම හේතුවක් නැතුව. කිසිම නිදහසට කරුණක් නැතුව. දැන් අපේ ආණ්ඩුව විසින් ආරම්භ කරලා තියෙන්නේ අපගේ සාම ප්‍රයත්නයේ දෙවැනි අදියර. දැන් අපි කරගෙන යන්නේ පහුගිය මාස තුන ඇතුලත සාමය සඳහා සංග්‍රාමයයි. මේ සාම සංග්‍රාමය කිසිම ද්‍රවිඩ හෝ වෙනත් කිසිම අප රටේ ජීවත් වන ජන කොටසකට විරුද්ධව කරන එකක් නෙමෙයි. මෙතැනදී මා තමුන්නාන්සේලාට මතක් කරන්නට කැමතියි යුද්ධමය කටයුතු ආරම්භ වුන විගස, එක්තරා දවසක ජාතිය අමතමින් මා කළ කථාවක වාක්‍ය කිපයක්. මටම අමතක වෙලා තිබුන. මේක දැක්කාමයි මතක් වුනේ. "සාමයෙන් සාමය උදා කර ගන්නට නොහැකි නම්, වෙනත් ඕනෑම මාර්ගයකින් හෝ සාමය උදා කර ගන්නට අප රජය කටයුතු කරන බවට මා පැහැදිලිව ප්‍රකාශ කරනවා." ඒ කියන්නේ යුද්ධ කරලා දමිලුන් විනාශ කරන්නට නෙවෙයි. දෙමළ ජනතාව

"දෙමළ ජනතාවටත් විරුද්ධ වන එල්.ටී.ටී.ඊ. ය සමඟ යුද්ධ කිරීම සඳහා පියවරෙන් පියවර සළකුණු කරපු පැහැදිලි සැලැස්මක් අද අපි හමුදවට ලබා දී තියෙනවා."

ඇතුළුව මුළු රටම අපේක්ෂා කරන සාමයට විරුද්ධ වෙන එල්.ටී.ටී.ඊ. යට පමණක් විරුද්ධවයි අපි යුද්ධ කරන්නේ.

සමහර මහාචාර්යවරු, ආචාර්යවරු වෙන කරගන්න දෙයක් නැතුව ජාතිවාදය පතුරුවන්න අද උන්මාදයෙන් දඟලනවා. ඒ ගොල්ල සමග කටයුතු කරන සමහර ජනතාවගේ නියෝජිතයින් පාර්ලිමේන්තුවෙත් ඉන්නවා ටික දෙනෙක් මේ ගොල්ල පහුගිය කාලෙ දිඹුලාගල ස්වාමීන්ද්‍රයන් වහන්සේ ඉතා කුරිරු ලෙස ඝාතනය කරපු වෙලාවේදි 1983 රට ගිනි තිබ්බා වගේ නැවත වතාවක් රට ගිනි තියන්න අසාර්ථක ප්‍රයත්නයක් දරපු බවත්, තමුන්නාන්සේලාට අපි අවධාරණය කළයුතුයි. ගාල්ලේ ගිනි තිබ්බේ එක්තරා දේශපාලන පක්ෂයකට අයිති කොටස් බව අද පොලිස් පරීක්ෂණවලින් හෙළිවෙලා තියෙනවා. ඒ එක්කම දිඹුලාගල ස්වාමින්ද්‍රයන් වහන්සේගේ අන්තිම කටයුතු කරපු සෙනසුරාද දවසට පෙර දින දෙකේ කොළඹ ඉතාම ජාතිවාදී හැඟීම් පතුරුවන භයානක නිර්නාමික පෝස්ටර් වාගයක්, අලවන්නට පෙළඹෙව්වෙත් ඒ පක්ෂයේම එක්තරා මන්ත්‍රීවරයෙක් කියලා තමුන්නාන්සේලාට අපි අවධාරනය කරන්න කැමතියි. මේවා සියල්ල අපි සොයාගෙන යනවා. වැරදිකරුවන්ට විරුද්ධව කටයුතු කරන බවත් තමුන්නාන්සේලාට මතක් කරනවා. කට උත්තර ගණනාවක් එළිවෙලා තියෙනවා සුදු සිල් රෙදි පොරවාගෙන බැටලුවො වාගේ පාර්ලිමේන්තුවේ අපි ඉදිරියේ හැසිරෙන මිනිස්සු මේවා කරන්නෙ.

මිත්‍රවරුනි, අද මා හිතන හැටියට මුළු ලෝකයා ඉදිරියේම තමුන්නාන්සේලා සියළු දෙනාම,

විශේෂයෙන් මේ රටේ ජීවත් වන සිංහල බෞද්ධයින් සිංහල බෞද්ධකම අගයන, ඉතාමත් උතුම් වර්ගයක් හැටියට, ඉතාමත් උතුම් ජන කොටසක් හැටියට ඉතිහාස ගත වෙලා ඉවරයි. එද 1983 මේ රටේ ඇතිවුන භයානකම පුළුල්ම ජාතිවාදී ගැටුමේදී මේ රටේ ජීවත්වුනු බහුතර සිංහල ජනතාව, එක ඇඟිල්ලක්වත් වෙන කාටවත් විරුද්ධව ඉස්සුවේ නැති නිසයි. ඒ සියළුම කටයුතු ඒ වෙලාවේ ආණ්ඩු කරපු පක්ෂයට අයිති මැරවරයන් කල්ලි තැනින් තැන දලා සිදු කරපු බවත්, තමුන්නාන්සේලාට අපට රහසක් නෙවෙයි. නමුත් එහෙම කරලා මුළු රටම ගිනි තියන්න, මුළු ජනතාවම අවුස්සන්න කරපු උත්සාහය එල දැරුවේ නැහැ. ඒ වාගේ තවත් අවස්ථාවන් ගණනාවක් තියෙනවා. එක එක්කෙනා ඒ වාගේ අවුස්සන්න හදපු ඒවා. අන්තිමට 1994 ජනාධිපතිවරණය වෙලාවෙදි ගාමිණී දිසානායක මැතිතුමාගේ ඝාතනයෙන් පසුව මේ රටේ ජනතාව අතර, අපේ රජයෙන් ලබා දුන්න රූපවාහිනී පහසුකම් පවා ප්‍රයෝජනයට ගනිමින් ජනතාව අවුස්සන්න විශාල ප්‍රයත්නයක් දැරුවා. පෝස්ටර් ඇලෙව්වා. මගේ පෝස්ටර් වල නලලට තිත් තිබ්බා. එකම පක්ෂයක උදවිය මේ ඔක්කොම කෙරුවේ. ඒවාට සම්බන්ධ එක එක පාට පොරව ගත්ත තවත් පොඩි ජාතිවාදී සිංහල වීරයො කීප දෙනෙක්ම ඉන්නවා. මහාචාර්යවරු, ආචාර්යවරු ඒ අතර ඉන්නවා. නමුත් ඒ සියල්ල අභිබවා ගිහිල්ලා ඒ සියළුම ඇවිස්සිලි හැඟීම් බර දේශපාලන ප්‍රකාශ ඉදිරියේ නොසෙල්වී මහා මෙර පර්වතයක් ලෙස ජනතාව තෝරා ගත් හරි මාර්ගය ඔස්සේ ගමන් කරපු

"ශත වර්ෂ ගණනාවකට පස්සේ නැවත වතාවක් හරි මගට යොමු කරලා ඉදිරියට ගෙන යන ලාංකීය සමාජය. ජාතිවාදි බෙදුම්වාදි පැත්තට නොහැරවීමට වග බලා ගත යුතුයි."

තමුන්නාන්සේලා සියළු දෙනාට අපි රජයක් හැටියට අපගේ උපහාරය දක්වන්නට මේ අවස්ථාවේදී නැවත වතාවක් හිස නමනවා.

මා හිතන හැටියට මේ සිංහල බෞද්ධ ජනතාවත් මේ රටේ ජීවත් වන අනෙකුත් බහුතර ජනතාවත් දන්නවා එල්.ටී.ටී.ඊ. ය අපට විරුද්ධව එල්ල කරන ප්‍රහාරය හමුවේ අපිත් සාර්ථක ප්‍රහාරයක් එල්ල කරන බව. අපි එහෙම කරන්නේ මේ අවස්ථාවේ වෙන විසඳුමක් නැති නිසයි. මිත්‍රවරුනි, මේ සැරේ මෙම ප්‍රහාරය සාර්ථක වෙනවා. වරදින්නේ නැහැ. සාර්ථකව එල්ල කරන ඒ ප්‍රහාරයට තමුන්නාන්සේලා සියළු දෙනාගේම ආශිර්වාදය පමණක් නොමෙයි ක්‍රියාකාරිත්වයත් අපට අවශ්‍ය වෙනවා. මොකද අපිට ගහනකොට අපි මැරෙන්න සූදානම් නැති නිසා. අපි එයට පිළිතුරු දුන්නත් මේ ප්‍රශ්නය යුද්ධයෙන්ම පමණක් විසඳන්න බැරි බවත් අපි තමුන්නාන්සේලාට පැහැදිලි කර දිය යුතුයි. අද අපි එල්.ටී.ටී.ඊ. ය උතුරේ පරාජය කෙරුවත් ඒ දෙමළ ජනතාවට අපේ රටේ සමාජ, දේශපාලන, ආර්ථික හා සංස්කෘතික තන්ත්‍රයන් තුළ දීර්ඝ කාලයක් තිස්සේ ඇතිවී තිබෙන ප්‍රශ්න විසදිය යුතුයි. මේ රටේ ජීවත්වන අනෙකුත් ජන කොටස් වලත් ප්‍රශ්න විසදිය යුතුයි. නැත්නම් නැවත වතාවක් එල්.ටී.ටී.ඊ. ය වෙනුවට තවත් එල්.ටී.ටී.ඊ. සංවිධානයක් මතුවෙලා එන බව තමුන්නාන්සේලාට විශේෂයෙන් කිවයුතු නැහැ.

71 දී ජනතා විමුක්ති පෙරමුණ මර්දනය කෙරුවා. 88 වෙනකොට ඊට වඩා භයංකාර අති භීෂණකාරී ජනතා විමුක්ති පෙරමුණක් ගොඩ නැගුනා. අද විජේවීර නෑ. විජේවීරට පණ

එන්නෙත් නෑ. නමුත් දකුණේ ජනතාවට ඇතිවී තිබෙන සමාජ, ආර්ථික හා සංස්කෘතික ප්‍රශ්න විසඳුනේ නැත්නම් වෙනත් විජේවීර කෙනෙක් මේ දකුණෙන් බිහිවෙන්නට පුළුවන්. අපි මුළු රටටම බලපාන සමාජ, ආර්ථික හා සංස්කෘතික ප්‍රශ්න වලට විසඳුම් හොයන අතර ඒ සියල්ල ඉටු කිරීමට තිබෙන ප්‍රධාන බාධකය වන ජන වාර්ගික ප්‍රශ්නයට ස්ථිරසාර විසඳුමක් ලබා දීමට කටයුතු කරනවා. ඒ ස්ථිරසාර විසඳුම දේශපාලනමය එකක් හැර වෙන කිසි එකක් නොවන බවත් නමුන්නාන්සේලාට මතක් කල යුතුයි.

අද මුළු උතුරුකරයම මහ අපායක්. වසර 12 ක් තිස්සේ මේ තරම් දුක් කරදර වලට මුහුණ දීගෙන ඒ අපාය තුළ ජීවත් වෙමින් තව දුරටත් සටන් කරනවා නම් මොවුන්ට මොකක් හරි ප්‍රශ්නයක් තියෙන්න ඕනෑ. ප්‍රභාකරන්ට බලහත්කාරයෙන් උතුරේ තරුණයන් අරගෙන ගිහිල්ලා අවුරුදු 12 ක් තිස්සේ යුද්ධයක් කරන්න බැහැ. සමහර වෙලාවට බලහත්කාරයෙනුත් ගන්නවා. දැන් එහෙම කරනවා. එතන ගැඹුරු ප්‍රශ්නයක් තියෙනවා. ඒ ප්‍රශ්නයට විසඳුම් හැටියට අද අපේ රජය දීර්ඝ වශයෙන් අවුරුදු ගණනාවක් තිස්සේ නොයෙකුත් අය හිතපු, නිර්මාණය කරපු දේවල් එකතු කරලා, ගොනු කරලා දේශපාලන විසඳුම් මාලාවක් හදලා තියෙනවා.

"ලියලමින් තිබූ ද්‍රවිඩ ජනතාවගේ ප්‍රශ්න වලට සාමකාමී විසඳුම් සොයනවා වෙනුවට ගහල. තලල. පෙලල. මිනී මරල ප්‍රශ්න විසඳන්න හිතපු ආණ්ඩුත් මේ රටේ තිබුනා."

අපේ දේශපාලන විසඳුම් මාලාව දැනටමත් විශේෂයෙන් ද්‍රවිඩ හා මුස්ලිම් ජනතාව නියෝජනය කරන පක්ෂ සමග සාකච්ඡා කරමින් පවතිනවා. ජී. එල්. පීරිස් ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් ඉදිරි සති

කිහිපය තුළ මෙම කටයුත්ත සිදු කරනවා. එම දේශපාලන විසඳුම් මාලාව ඉදිරියේ දී මේ රටේ ජනතාව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු යොදනවා.

උතුරු නැගෙනහිර දැනට පවතින සංග්‍රාමය පිළිබඳව තමුන්නාන්සේලා දන්නවා. ඒ නිසා ඒ පිළිබඳ විස්තර කියන්නට මා මේ අවස්ථාවේදී බලාපොරොත්තු වෙන්නේ නෑ. නමුත් අද පවතින නොයෙකුත් බොරු ප්‍රචාර පිළිබඳව වචනයක් කියන්නට ඕනේ. මිත්‍රවරුනි, නොයෙක් නොයෙක් දේවල් අද පත්තර වලින් කියනවා. ඒ අයට පත්තර විකුණගන්න ඕන නිසා ඕන එකක් කියන්න අපි ඉඩ දෙනවා. එහෙම නොවුනොත් ඒ මිනිසුන්ටත් රැකියා හොයල දෙන්න අපට සිද්ධ වෙනවා. පත්තර කාරයො එක දවසක කියනවා පලාලි කඳවුර වට කරල දැන් ගහන්න ලෑස්තියි, කන්න නෑ අමු පැපොල් කනව කියලා. යුද්ධය පටන් ගන්නකොටම අපි සියල්ල බලලයි තිබුනෙ. උතුරේ සියළුම කඳවුරුවලට සුමාන 6 කට වැඩිය සමහර ඒවායේ මාස 6 දක්වා අඩු තරමින් අවශ්‍ය වියලි ආහාර ද්‍රව්‍ය සියල්ල තිබුනා. හාල්, පොල්,පරිප්පු, කරවල, ලූනු, මිරිස් ආදිය තිබුනා.නමුත් ගුවන් ප්‍රහාරයට පසුව ටික දවසක් යන තුරු කොළ ජාති, අමු එළවළු වර්ග ගෙනයන්න බැරි වෙලා තියෙනවා.

අපි තමුන්නාන්සේලාට මතක් කරනවා එද ජාතිවාදයට ඇද දමමින්, කිසිම පැහැදිලි සටන් සැලැස්මක් නැතිව, යම් යම් තැන්වල ජයග්‍රහණය ලැබුණට පොදුවේ මහා විනාශකාරී යුද්ධයකට ඇද දමා තිබුණ හමුදාවට අද අපි පැහැදිලි සැලැස්මක් ලබා දීල පියවරෙන් පියවරට සළකුණු කරල, ඔවුන්ගේ යුද්ධය සඳහා තියෙන ආකල්පය, සම්පූර්ණ පරිවර්තනයක් ඇති කරල මේ යුද්ධය දෙමළ ජනතාවට විරුද්ධව කරන යුද්ධයක්

නෙමෙයි, දෙමළ ජනතාවටත් විරුද්ධව සටන් කරන එල්.ටී.ටී.ඊ. යට විරුද්ධව කෙරෙන යුද්ධයක් බවට අපි ඔවුන්ගේ අදහස් පරිවර්තනය කරල අද මේ කටයුත්ත ගෙන යන්නෙ. ඊයෙ දවසෙත් අනුරුද්ධ රත්වත්තේ ඇමතිතුමා උතුරේ හමුද කඳවුරු ගණනාවක ගුවනින් ගිහිල්ලා ඇවිල්ල තියෙන්නෙ. මිසයිල එහෙම තිබුනෙ නැහැ. නැත්නම් එතුමා මෙතන නැහැ. එතුමා අපට එසේ කියන්නෙ පෞද්ගලිකව ගිහිල්ල බලල ආපු නිසයි. ඒ සියළුම කඳවුරු වල සිටින හමුද හටයින් විශාල ආත්ම ශක්තියක් ඇතිව මේ සටන අපිට ජය ගන්න පුළුවන් කියන තත්වයක සිටින බව දැනගන්නට ලැබුණා.

අද අපි මේ සුදු නෙළුම් ව්‍යාපාරය තුළින් තමුන්නාන්සේලා සියළු දෙනාගෙන්ම ඉල්ලා සිටින්නේ මේ සාමය ලබා ගැනීම සඳහා අපි කරන වැඩ වලට සහයෝගය දෙන ලෙස. මේ මොහොතේ සංග්‍රාමය වෙන්න පුළුවන්, ඊළගට නැවත වතාවක් දේශපාලන කටයුතු වෙන්න පුළුවන්. ඊළගට නැවත වතාවක් සාකච්ඡා වෙන්නත් පුළුවන්. ඒහැම මොහොතකදීම ඒ හැම අදියරකදීම මේ රටේ සාමය අපේක්ෂා කරන සියළුම දෙනා, සියළුම ජාතීන්, ආගම්, භාෂා. සියළුම දේශපාලන පැති වලටත් අයිති සියළුම දෙනාගේ සහභාගිත්වය අපේ මේ සටනට අවශ්‍ය බවයි අපි තමුන්නාන්සේලාට සුදු නෙළුම් ව්‍යාපාරය තුළින් ප්‍රකාශ කරන්නෙ.

හැම කෙනාම අවි ආයුධ අරගෙන, තුවක්කු අරගෙන, උතුරට ගිහිල්ල, නැගෙනහිරට ගිහිල්ල යුද්ධයට සම්බන්ධ

> " සිංහල බෞද්ධකම අගයන ඉතාම උතුම් ජන කොටසක් හැටියට මේ රටේ ජනතාව ජාත්‍යන්තර ප්‍රජාව හමුවේ වර්තමානයේදී ඉතිහාසගත වුනා. "

වෙන්න අවශ්‍ය නැහැ. ඒක අපි හැමෝටම කරන්නත් බැහැ. නමුත්, අපිට උතුරු. නැගෙනහිර සටන් කරන අපේ වීර සෙබළුන්ට නොයෙකුත් ආකාරයෙන් ආධාර කරන්න පුළුවන්. ඒ වගේම මේ සටන ජාතිවාදී පැත්තකට හරවන්න දෙන්නේ නැතුව, මේ සටන අපි ඉතා අමාරුවෙන් ශතවර්ෂ ගණනාවකට පස්සේ නැවත වතාවක් හරි මගට යොමු කරල, ඉදිරියට ගෙන යන මේ ලාංකීය සමාජය, නැවත වතාවක් ජාතිවාදී බෙදුම්වාදී පැත්තට හැරෙන්න දෙන්නේ නැතිව පැහැදිලි දේශපාලන දර්ශනයක් ඇතුව ඉදිරියට ගෙන යාමේදී ගම්වල, දේශපාලන නායකත්වය දෙන් නමුන්නාන්සේලා හැම කෙනාගෙන්ම අපිට විශාල වැඩ කොටසක් කර ගන්නට අවශ්‍යව තිබෙනවා. එක පැත්තකින් හමුදවල සිටින හමුද හටයින් ගම්වල ජීවත්වන හැටි නමුන්නාන්සේලා අපිට වැඩිය හොඳට දන්නවා. ඒ පවුල් වලට දේශපාලන වශයෙන් හැම මැතිවරණ කොට්ඨාශයකම සංවිධානය වෙලා අපි දැන් පිහිටුවා ගෙන යන සුදු නෙළුම් කමිටු තුළින් නොයෙකුත් සුභ සාධන කටයුතු කරන්න පුළුවන්.

ඒ වගේම උතුරු නැගෙනහිර යුද්ධයට ගිහිල්ල ජීවිත පූජා කොට ගම් රටවලට මිනී පෙට්ටිවල ගේන අපේ සහෝදරවරුන්ට අඩු තරමින් රට වෙනුවෙන් කරපු කැපවීම සඳහා විරුවන්ට ලබාදෙන අවසන් කටයුතු අපිට සංවිධානය කරන්න පුළුවන්. ඒ වගේම ජාතික ආරක්ෂක අරමුදල අද අපි පාවිච්චි කරන්නේ යුද්ධයට, අවි ආයුධ ගන්න නෙමෙයි. තනිකරම යුද්ධ කරන අයගේ සුභ සාධන කටයුතු වලට පමණයි. ඒ කටයුතු සඳහා අපි ආරම්භ කරල

තිබෙන, අද හෙට ආරම්භ කරන්න යන සුදු නෙළුම් කොඩිය හැම ගමකම, හැම ගෙදරකටම, විකිණීමට තමුන්නාන්සේලාට සම්බන්ධ වෙන්න පුළුවන්. ඒ වගේම අනිත් පැත්තෙන් උතුරු නැගෙනහිරට මායිම් වෙලා තියෙන තර්ජන ලත් ගම්මාන වල ජීවත්වන ජනතාව විශාල ප්‍රශ්න රාශියක් මැද්දේ අද ජීවත්වෙන්නෙ. ඔවුන්ට සමහර තැන්වල බොන්න වතුර නැහැ. යන එන මගක් නැහැ. වැඩි හරියක් අද වෙළෙන්දන් පවා ඒ ගම්වලට යන්නේ නැහැ. තියෙන තර්ජන වල බයට. ඔවුන්ට අත්‍යවශ්‍ය වෙන සේවාවන්, භාණ්ඩ රාශියක් නැහැ. දැනටමත් මන්ත්‍රීවරු කණ්ඩායම් හැටියට සංවිධානය වෙලා අනුරාධපුර, පොළොන්නරුව, අම්පාර වැනි දිස්ත්‍රික්ක වල ගම්මාන වලට යන්නට පටන් ගෙන තියෙනවා. ඒ ගම්මාන වලට අවශ්‍ය දේවල් ඉටු කර දෙන්නට. ඒක මීට වැඩිය සංවිධානාත්මකව අපි සුදු නෙළුම් ව්‍යාපාරය තුළින් කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වගේම අපිට යා හැකි තැන්වල හමුද කඳවුරු වල සිටින සොල්දාදුවන්ට යම් යම් අඩු පාඩුකම් තියෙනවා. අවි ආයුධ නෙමෙයි සුබ සාධන පැත්තෙන්. ඒවා සපුරාලන්නත්, යා යුතු, යා හැකි තැන්වලට ගිහිල්ල අපේ දේශපාලන නායකයින් ඒ කටයුතු කරන්නටත්, සුදු නෙළුම් ව්‍යාපාරය තුළින් බලාපොරොත්තු වෙනවා.

"ඉතා අනර්ථකාරී ලෙස ඔඩු දුවපු මේ ප්‍රශ්නය විසඳීමේදී අපේ වැඩ පිළිවෙල හා උපාය මාර්ග හැම අවස්ථාවකදීම හෙළි කරන්නට බැහැ."

ඒ වගේම දශක ගණනාවක් තිස්සේ විශේෂයෙන් විසි වෙනි ශත වර්ෂය පුරාම අප රටේ ජීවත් වන ජන කොටස් අතර පතුරුවා තිබෙන බෙදුම්වාදී දේශපාලනය, බෙදුම්වාදී ආකල්පය, වෙනස් කරමින් විශාල ප්‍රචාර වැඩ පිළිවෙලක් දැනටමත් අපි ආරම්භ කරන්න කටයුතු යොදල

තියෙනවා. ඒ සඳහා තමුන්නාන්සේලාගේ නායකත්වයෙන් ගම් මට්ටමින් සම්මන්ත්‍රණ, පැහැදිලි කරදීම්, රැස්වීම්, සාකච්ඡා, සංස්කෘතික වැඩපිළිවෙලවල් සංවිධානය කරන්නට පුළුවන්. සුදු නෙළුම් ව්‍යාපාරය තුළින් පාසල් ශිෂ්‍යයන්ට වෙනම ම වැඩ පිළිවෙලක් තියෙනවා. ඒ වැඩ පිළිවෙල අධ්‍යාපන ඇමතිතුමාත් සමග සාකච්ඡා කරල ආරම්භ කරන්නට ඉදිරි සති කිහිපය තුළ බලාපොරොත්තු වෙනවා.

කොටින්ම කිව්වොත් ඒ පැත්තේ අපේ සහෝදරවරු යුද්ධය කරල, ජීවිත පූජාවෙන් සාමය ලබාගන්නට සටන් කරන අතර මේ පැත්තේ තමුන්නාන්සේලා අපි සියළු දෙනාම ඒ ලබා ගත්ත සාමය නැවත වතාවක් පලුදු වෙන්න ඉඩ තියන්නේ නැතුව ස්ථිරසාර සාමයක් බවට පත් කර ගන්න පුළුවන්. අපට ඒ පිළිබඳව ආඩම්බර විය හැකි ලාංකීය දේශයක් ගොඩ නගන්නට තමුන්නාන්සේලාට පුළුවන් මේ සුදු නෙළුම් ව්‍යාපාරය තුළින්. ඒ අභියෝගය භාර ගන්නට කියල අපි ආරාධනා කරනවා.

අද පිපුනු සුදු නෙළුම් ව්‍යාපාරය අපි තව ටික දවසකින් මැරී යන්නට ඉඩ දෙන්නේ නැතුව දිගින් දිගටම තව තවත් සුදු නෙළුම් මල් දස දහසක් පිපෙන්නට තමුන්නාන්සේලා අපි එකට අත්වැල් බැඳගෙන සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් සියළුම ආගම් වල අය අපේ ලංකාව තව දුරටත් ශක්තිමත් දියුණු රටක් හැටියට ඉදිරියට යන්නට අපි බලාපොරොත්තු වෙනව නම් මේ සමෘද්ධිය, සංවර්ධනය ඇති කරන්නට නම් පළමුවෙන් සාමය ඇති කරගෙන ඒ තුළින් සියළුම ජන කොටස් අතර සහෝදරත්වය ඇති කර ගෙන තවත් මින් ඉදිරියේදී

කවදාවත් පළුදු නොවන ස්ථිරසාර සාමයත්, ජාතීන් අතර සමගියත්, සහෝදරත්වයත් ඇති කර ගන්නයි කියල තමුන්නාන්සේලා සියළු දෙනාටම අපි මේ අවස්ථාවේදි යෝජනා කරනවා.

ඒ සඳහා අපි සමහර විට මෙතෙක් කල් හිතපු විධි, අපිට හැගුන විදියවල් සමහර විට එළියට අරගෙන, සෝදලා සුද්ද කර ගන්න සිදු වෙනවා. සමහර විට අපි හිතන්නෙම නැතුව කරපු වැරදි වෙනස් කර ගන්නට. නමුත් එසේ කරන්නට, දැන් අද මේ මොහොත එළඹිලා තියෙන බව මා අවධාරණයෙන් තමුන්නාන්සේලාට මතක් කරනවා. ඒ සඳහා සුදු නෙළුම් ව්‍යාපාරය මෙහෙයවපු මංගල සමරවීර ඇමතිතුමා ඇතුළු අපේ සියළුම මන්ත්‍රීවරුන්ට හා තමුන්නාන්සේලා සියළු දෙනාම වෙනුවෙන් මගේ අවංක ස්තුතිය පුද කරමින්, අප රජයට, පොදු ජන එක්සත් පෙරමුණට සම්බන්ධ සියළුම පක්ෂවල නායකයින් ඇතුළු සියළුම සාමාජිකයින්ටත්, මේ රටේ ජීවත් වෙන සියළුම ජන කොටස් වලට ආගම් වලට අයත්, සියළු දෙනා ම අපට ලබා දෙන සහයෝගයට මගේත්, අප රජයේත් අවංක ස්තුතිය පුද කරමින් සුදු නෙළුම් ව්‍යාපාරය තුළින් අද පිපුණු සුදු නෙළුම් මල් නව දස දහසක්, දස ලක්ෂ ගණනාවක් දක්වා මේ රටේ සියළුම ජනතාවගේ හදවත් තුල පිපේවා කියා ප්‍රාර්ථනා කරමි.

තමුන්නාන්සේලා සියළු දෙනාටම ස්තුතියි.

"අද පිපුන
සුදු නෙළුම් ව්‍යාපාරය
තව ටික දවසකින්
මැරී යන්නට ඉඩ නොදී
තවත්
සුදු නෙළුම් මල්
දස දහසක් පිපෙන්නට
අපි තමුන්නාන්සේලා
එකට
අත්වැල් බැඳ ගනිමු."

REFERENCE
ජනාධිපති කාර්යාලය
පුස්තකාලය



[illegible]

ප්‍රකාශනයකි

1995 ජූලි